


# 05 ශ්‍රේණිය

# ගමනාගමනය



නම: ............................................ පාසල: ..................................................

සැකසුම : එම්. එම්. කේ. එස්. කුමාරි

## ❖ මංමාවත් භාවිතයේ දී මගීන් හා රියදුරන් විසින් කරනු ලබන වැරදි

| පදිකයින් / මගීන් | රියදුරන් |
|---|---|
| ➢ වම් පසින් ගමන් කිරීම.<br>➢ අපද්‍රව්‍ය පාරට දැමීම.<br>➢ රංචු ගැසී ගමන් කිරීම.<br>➢ බසයේ පා පුවරුවේ යාම.<br>➢ පොදු වාහන වල ආසන ඉරීම.<br>➢ පදික මාරුවක් නොමැති ව පාර මාරු වීම.<br>➢ පාර මාරු වීමේදී ආලෝක සංඥාවලට අවනත නොවීම.<br>➢ වාහන වල කුරුටු ගෑම.<br>➢ මාර්ගයේ ක්‍රීඩා කිරීම.<br>➢ මාර්ගයේ ගමන් කරන වාහන වලට ගල් ගැසීම.<br>➢ මාර්ගයේ දෙපස ඇති ගස් වලට සහ දේපළ වලට හානි කිරීම. | ➢ අධික වේගයෙන් ගමන් කිරීම.<br>➢ බීමත් ව රිය පැදවීම.<br>➢ මාර්ග නීති නොපිළිපැදීම.<br>➢ වැරදි ස්ථාන වල වාහන නැවැත්වීම.<br>➢ පමණ ඉක්මවා භාණ්ඩ හෝ මගීන් පටවාගෙන යාම.<br>➢ දුරකථන භාවිතා කරමින් වාහන පැදවීම.<br>➢ දකුණු පසින් වාහන පැදවීම.<br>➢ වම් පසින් ඉස්සර කිරීම.<br>➢ කැසට් යන්ත්‍රය අධික ශබ්දයෙන් ක්‍රියාත්මක කර ධාවනය කිරීම.<br>➢ අනවශ්‍ය ලෙස රථයේ නළාව ශබ්ද කිරීම. |

## ❖ රියදුරන් පිළිපැදිය යුතු මාර්ග නීති

1.වම් පසින් වාහන පැදවීම.

2. වටරවුමක දී දකුණු පසින් එන වාහනවලට ඉඩ ලබා දීම.

3. කදු ප්‍රදේශයක දී කන්ද දෙසට ධාවනය වන වාහනවලට මූලිකත්වය දීම.

4. දකුණු පසින් පමණක් වාහන ඉස්සර කිරීම.

5. පාරේ ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව පරෙස්සම පිළිබඳ අවධානයෙන් හා අවබෝධයෙන් වාහන ධාවනය කළ යුතු වීම.

6. වාහනයට ඉස්සර කිරීමේ දී ඉදිරියේ තිබෙන වාහනයට දකුණු පසින් පමණක් ධාවනය කළ යුතු බව.

7. අධිවේගී මාර්ගයේ දී වේගයෙන් ධාවනය කරන වාහන නිරුපද්‍රිත ව ගමන් කිරීම උදෙසා සෙමින් ධාවනය වන වාහන දකුණු තීරුවෙන් වම් තීරුවට මාරු වී දකුණු තීරුවේ ධාවනයට ඉඩ ලබා දිය යුතු බව.

මහා මාර්ගයේ ගමන් ගන්නා ඇස් නොපෙනෙන අයට, මහලු අයට, උදවු අවශ්‍ය විට උදවු කිරීම.

බසයක ගමන් ගන්නා විට වෙන් කළ ආසන හිමි අය පැමිණි විට නැගිට ඔවුනට එම ආසන ලබාදීමට කටයුතු කිරීම ( ආබාධිත අයට, පූජ්‍ය පක්ෂයට ,ගර්භනී මාතාවන්ට)

- **ගමනාගමනයේ දී පදිකයින්, මගීන් සැළකිලිමත් විය යුතු කරුණු**

1.පාරේ දකුණු පසින් ගමන් කිරීම.

2. පාරේ ගමන් ගන්නා අන්ධ, මහලු අයට උදවු කිරීම.

3. මාර්ගවලට කුණු කසළ නොදැමීම.

4. පා පුවරුවේ ගමන් නොකිරීම.

5. පොදු වාහනවලට හානි නොකිරීම.

6. බසයක දී නම් වෙන් කළ ආසන හිමි ( පූජ්‍ය පක්ෂය, ගැබිණි මව්වරු, ආබාධිතයන් ) අය සඳහා මූලිකත්වය දීම.

- **මහා මාර්ගවල දැකිය හැකි රථවාහන ආලෝක සංඥා පද්ධතිය හඳුනා ගනිමු**



- රතු - වාහනය නතර කරන්න.
- කහ - රථය ගමනට සූදානම් කරන්න.
- කොළ - ගමන ආරම්භ කරන්න.

## ❖ පදිකයින් පාර මාරු වීම සඳහා වන සංඥා



- රතු වර්ණය ( අංකය රූපය) දිස්වේ නම් පාර හරහා මාරු වීම නොකළ යුතු ය.
- කොළ වර්ණය(අංකය රූපය) දිස්වේ නම් පාර හරහා මාරු වන්න.

➢ පාර හරහා මාරු වීමට අවශ්‍ය නම් සංඥා කුලුනේ ඇති බොත්තම ඔබා සංඥා කුලුනේ දිස්වන මගියා කොළ පාටින් දිස්වන විට හා අංකය අනුව පාර මාරු විය හැකිය.

## ❖ පාරේ ගමන් කරන විශේෂ වාහන හා ඒවායේ භාවිතාවන සංඥා ලාම්පු සහ ඊට අදාළ විශේෂ හඬවල්

**ගිලන් රථය**



**ආපදා රථය**



**විශේෂ ආරක්ෂණ රථ**



**දිගෙන් වැඩි රථ ( containers)**



➢ ගිලන් රථයක AMBULANCE යන වචනය ප්‍රදර්ශනය කර ඇත්තේ මුහුණු බලන කණ්ණාඩියකින් පෙනෙන පරිදි පැති මාරු වී දිස්වන ආකාරයටයි. ඉන් බලාපොරොත්තු වෙන්නේ එය තම පැති කණ්ණාඩි වලින් අනෙක් වාහන වල රියදුරන්ට නිවැරදි පැත්තට පෙනීම සඳහා ය.


## ❖ ශ්‍රී ලංකාවේ තිබෙන මාර්ග වර්ග

1.අඩි පාරවල් (ගුරු පාර)
2. දුම්රිය මාර්ග
3. මහා මාර්ග
4. අධිවේගී මාර්ග

❖ **මාර්ග නොදන්නා ප්‍රදේශයක ගමන් කිරීමේදී යම් ස්ථානයකට යාමට නිශ්චිත මාර්ග සොයා ගැනීමට පහත ක්‍රම භාවිතා කළ හැකිය.**

➢ මාර්ග සිතියම්
➢ පරිගණකවල / ජංගම දුරකථන වල
➢ භාවිත Map මෘදුකාංගය ( google සිතියම)


❖ **සිතියම් වල මාර්ග හඳුනා ගැනීමට යොදා ඇති සංකේත**





➢ අධිවේගී මාර්ගය (දම් පාට)
➢ මහා මාර්ග (රතු පාට)
➢ දුම්රිය මාර්ග ( කළු පාට )

❖ **ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන මාර්ග**


**1.කොළඹ සිට මහනුවර**





**2. කොළඹ සිට කුරුණෑගල**




**3. කොළඹ සිට මාතර**



**4. කොළඹ සිට අනුරාධපුරය**



**5. කොළඹ සිට ඇඹිලිපිටිය**



**6. කොළඹ සිට යාපනය**




## ❖ ශ්‍රී ලංකාවේ ප්‍රධාන දුම්රිය මාර්ග කිහිපයක්

1.කොළඹ සිට මඩකලපුව

2. කොළඹ සිට මාතර ( මුහුදුබඩ දුම්රිය මාර්ගය)

3. කොළඹ සිට අවිස්සාවේල්ල ( කැලණිවැලි දුම්රිය මාර්ගය)

➢ යම් ස්ථානයක සිට තවත් ස්ථානයකට යා හැකි කෙටි ම මාර්ගය, තමන්ගේ නිවසට/ පාසලට යා හැකි මාර්ගය සිතියමකට අඳින්න.

## ❖ මාර්ග සිතියමක් භාවිතා කිරීමේ ඇති වැදගත්කම

1.ඥාතියෙකුගේ මංගල කටයුත්තකට සහභාගි වීමට යාමට.

2. වන්දනා චාරිකාවක්/ අධ්‍යාපන චාරිකාවක් සඳහා යම් ස්ථානයකට යාමට.

## ❖ එදිනෙදා ජීවිතයේ දී මාර්ග සිතියමක් භාවිතා කිරීමට සිදුවන වෙනත් අවස්ථා

1.එක් ස්ථානයක සිට යම්කිසි ස්ථානයකට ඇති දුර ප්‍රමාණය සොයා ගැනීමට.

2. යම්කිසි ස්ථානයකට ළඟා වීමට යා යුතු මාර්ගය සොයා ගැනීමට.

3. අඩු කාලයකින් පහසුවෙන් යම්කිසි ස්ථානයකට ළඟා වීමට.

4. විදේශිකයෙකුට සංචාරකයෙකුට පවා නොදන්නා ප්‍රදේශයක දී ගමන් ගන්නා මාර්ගය සොයා ගැනීමට.

සෑම මාර්ගයකම දුර ප්‍රමාණ මාර්ගය දෙපස පුවරු වල දක්වා තිබෙනවා. යම් ස්ථානයකට ළඟා වීමට වර්තමානයේ ඉතා පහසු ක්‍රම තිබේ. සුහුරු ( SMART) ජංගම දුරකථනයකින් එය පහසුවෙන් සොයා ගත හැකිවේ. මේ සඳහා GOOGLE DRIVE APP භාවිතා කළ හැකිය. බොහෝ රියදුරන් වර්තමානයේ දී මෙම යෙදවුම මගින් ගමනාගමනය පහසු කර ගන්නවා.

## ❖ අධිවේගී මාර්ගයක ගමන් කිරීමේ දී අප පිළිපැදිය යුතු කරුණු

1.වාහන අධිවේගී මාර්ගයේ ධාවනයට සුදුසු මට්ටමින් පවතී ද යන්න සොයා බැලීම. උදා : තිරිංග පද්ධතිය , ටයර්වල ගුණාත්මක බව, එන්ජිමේ ගුණාත්මක බව

2. ආසන පටි හොඳින් පැලඳ ගැනීම.
3. ගමනට නියමිත ප්‍රවේශ පත්‍රය ලබා ගැනීම.
4. නියමිත පරතරය සහිතව වාහනය ධාවනය කිරීම.
5. නියමිත වේගසීමාවල ධාවනය කිරීම.
6. වාහනයකට ඉස්සර කිරීමේ දී හැර දකුණු මංතීරුවෙන් ධාවනය නොකිරීම.

❖ **ප්‍රධාන මාර්ග ශ්‍රේණිගත කර ඇති ආකාරය**

**1.කොළඹ – මහනුවර A1**



**2. කොළඹ - ගාල්ල A2**



**3. කොළඹ – පුත්තලම A3**



**4. කොළඹ – කුරුණෑගල A6**



**5. කොළඹ – මඩකලපුව A4**



**6. මහනුවර - යාපනය A9**



❖ **ශ්‍රී ලංකාවේ පිහිටි ගුවන් තොටුපළවල්**

**1.කටුනායක (කොළඹ)**



**2. මත්තල (හම්බන්තොට)**



**3. පලාලි (යාපනය)** **4. රත්මලාන (කොළඹ)**







## ❖ ශ්‍රී ලංකාවේ පිහිටි වරායවල්

**1.ත්‍රිකුණාමලය (ස්වභාවික වරාය)** **2. කොළඹ**





**3. ගාල්ල** **4. හම්බන්තොට**





## ❖ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සේවයට වඩා නීතිරීති පද්ධතියක් හා ආචාරධර්ම පද්ධතියක් ගුවන් ගමන් සදහා පවතී.

- ගුවන් ගමන් සදහා ප්‍රවේශ පත්‍ර කලින් ලබාගත යුතු බව
- විදේශීය රටකට යාමට අපේක්ෂා කරන්නෙකු විසින් එම රටට ඇතුළු වීමට වීසා බලපත්‍රයක් ලබා ගත යුතු බව
- ගුවන් ගමන් සදහා කල් ඇති ව (අවම වශයෙන් පැය 3 කට පමණ පෙර) ගුවන් තොටුපළ වෙත යු යුතු බව
- රැගෙන යා හැකි අනුමත උපරිම බර ප්‍රමාණයක් ඇති බව

- **සිසුන් පාසල් පැමිණෙන ආකාර**

1.පයින් 2. පාසල් වෑන් රථයෙන් 3. පාසල් බස් රථයෙන්

4.මෝටර් රථයෙන් 5. යතුරු පැදියෙන් 6. පා පැදියෙන්

7. ත්‍රී රෝද රථයෙන්

- **පොදු වාහන**

**1.බස් රථය** **2. දුම්රිය** **3. ගුවන් යානය**







**4. පාලම් පාරු (ඇතැම් ප්‍රදේශවල)** **5. බෝට්ටු (ඇතැම් ප්‍රදේශවල)**





- **පොදු වාහනවල ගමන් කිරීමෙන් අපට සැලසෙන වාසි**

1.සහනදායී මිලකට ගමන් කළ හැකි වීම.

2. පෞද්ගලික වාහන මෙන් පොදු වාහන නඩත්තු කිරීමට මගියාට සිදු නොවීම.

3. පෞද්ගලික වාහන රාශියක් එකතු වීමෙන් මාර්ගයේ ඇතිවන තදබදය ඇති නොවීම.

4. පෞද්ගලික වාහන මෙන් රථය තමන් විසින් ම පදවාගෙන යායුතු නොවීම.

5. අනාරක්ෂිත බව අඩු වීම.

- **පොදු වාහන භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු**
  - දුම්බීමෙන් වැළකීම.
  - වැඩිහිටියන්ට , රෝගී අයට සහ ගර්භනී මාතාවන්ට ආසන පිරිනැමීම.
  - පා පුවරුවේ ගමන් නොකිරීම.
  - අන් අයට හිරිහැර වන ලෙස නොහැසිරීම.
  - ගමන් කරන විට වාහනයෙන් පිටතට හිස / අත නොදැමීම.

- බස් රථයෙන් ඇතුළත/ පිටත කුණු  නොදැමීම.
- දුරකථන භාවිතය අවම කිරීම.
- ආසන වලට හානි නොකිරීම.
- දුම්රියවල වැසිකිළි ආදිය අපිරිසිදු නොකිරීම.

❖ **පොදු වාහනවල ලක්ෂණ**

- කාල සටහනකට අනුව ගමන් කිරීම.
- මගීන් වෙනුවෙන් ටිකට්පතක් නිකුත් කිරීම. ( බස්රථ ,දුම්රිය)
- පොදුවේ ඕනෑම මගියෙකුට ගමන් කිරීමට හැකිවීම.
- මගීන් වෙනුවෙන් පහසුකම් සලසා තිබීම.

❖ **අතීත ගමනාගමන ක්‍රම**

**1.පයින් යෑම**



**2. දෝලාවෙන් යෑම**



**3. තිරික්කලය**



**4. කරත්තය**



**5. අශ්ව කරත්තය**



**6. අශ්වයා පිට යාම**



**7. අලියා පිට යාම**



**8. දුම්කෝච්චිය**



**9. එන්ජිම සහිත දුම්රිය**



**10. ඔරුව** **11. පාරුව** **12. රුවල් ඔරුව**







**13. බෝට්ටු** **14. රුවල් නැව** **15. එන්ජිම සහිත නැව**







- රජවරු ⟶ දෝලාවෙන් යාම

  අලියා පිට යාම

  අශ්වයන් පිට යාම

  අශ්ව කරත්තවලින් යාම

- සාමාන්‍ය ජනයා ⟶ පයින් ගමන් කිරීම

  කරත්ත භාවිතා කිරීම

  ඔරු / පාරු භාවිතා කිරීම

- අසනීප/ වැඩිහිටි/ ගිලන් අය ⟶ පුටුවක ලී මැද ඔසවාගෙන යාම

**අතීතයේ රාවණා නම් රජ කෙනෙක් දඬුමොනරය භාවිතා කර ගමන් බිමන් ගිය බව කියැවේ.**

## ❖ වර්තමානයේ භාවිතා කරන දියුණු ප්‍රවාහන ක්‍රම

1.ගොඩබිම : කාර්, වෑන් ,යතුරුපැදි ,වෙනත් මෝටර් වාහන

2. ජලය : බෝට්ටු , නැව්

3. ගුවනෙහි : ගුවන්යානා, හෙලිකොප්ටර් ,රොකට් ,පැරෂුට්

- **අතීතයේ භාවිතා කළ ප්‍රවාහන ක්‍රම වර්තමානයේ භාවිතා කරන නවීන ක්‍රම දක්වා සංවර්ධනය වීමට බලපෑ හේතු**

**1.විදේශ ආක්‍රමණ**

පෘතුගීසි ලන්දේසි ඉංග්‍රීසි ආක්‍රමණවලදී ඔවුහු අපට නවීන ප්‍රවාහන ක්‍රම හඳුන්වා දෙන ලදී.

**2. වැවිලි කර්මාන්තය**

විශේෂයෙන් තේ කොළ ප්‍රවාහනය සඳහා මාර්ග පද්ධතිය දියුණු කළේය.

**3. තාක්ෂණයේ දියුණුව**

- **වර්තමාන ප්‍රවාහන ක්‍රමවල වාසි**

1.ඉන්ධන දහනය අඩු වාහන නිසා පරිසර හිතකාමී වීම.

2. පහසුකම් වැඩි පොදු වාහන නිසා මාර්ග තදබදය අවම වීම.

3. වැඩි පිරිසකට එකවර ගමන් කළ හැකි වීම.

4. විශාල භාණ්ඩ ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකි වීම.

5. කාලය ඉතිරි වීම.

6. ආරක්ෂාකාරීව ගමන් කළ හැකි වීම.

7. විදේශ රටවලට පවා ගමන් කළ හැකි වීම.

- **පහත දේ සඳහා නිර්මාණ කරන්න.**

1.අතීත පුරාවෘත්තවල සඳහන් දඬු මොනරය.

2. අනාගතයේ දී ගමනාගමනය සඳහන් ඔබ අපේක්ෂිත වාහනය. ( Dream Vehicle)

- **මාර්ග ආලෝක සංඥා පද්ධතියක් සාදමු**


**අවශ්‍ය ද්‍රව්‍ය :**

1.ලෑලි කැබැල්ලක් 2. වියළි කෝෂයක් 3. කුඩා බල්බ තුනක්

4. වයර් කැබලි කිහිපයක් 5. ඇමුණුම් කටුවක් 6. ඩ්‍රෝවින් පින් කිහිපයක්

7. සෙලෝපේන් කඩදාසි (රතු, කොළ , කහ )

සාදන ආකාරය :



- බල්බ තුන රතු , කොළ, කහ සෙලෝපේන් කඩදාසිවලින් ආවරණය කර හෝ එම පාටවලින් පාට කරන්න.
- ඉන් අනතුරුව රූප සටහනේ ආකාරයට ඇටවුමක් සකස් කර ගන්න.
- ස්විචයේ ඇමුණුම් කටුව එක් එක් ඇණ පිහිටීමට ගෙන යමින් සෙල්ලම් මාර්ග සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය බලන්න.

❖ **කෝච්චියෙන් කොළඹ යාම**

- පහත සඳහන් ද්‍රව්‍ය සූදානම් කර ගන්න.

➢ රතු කහ කොළ සංඥා පුවරු
➢ දුම්රිය ස්ථානයක දී පණිවිඩ හුවමාරුව සඳහා ලබාදෙන වළල්ලක ආකෘතියක්
➢ විසිල් එකක්

- සිසුන් කෝච්චියක් ආකාරයට සූදානම් කරන්න.
- ආරම්භක සිසුවා රියැදුරු වේ. ඔහුගේ උරහිසට වම් අත තබා ඊළග සිසුවා සිටියි. අනෙකුත් සියලු සිසුන් ඒ අයුරින් සිටගත යුතු ය. අවසන් සිසුවා දුම්රිය නියාමක වේ.
- විසිල් හඬට කෝච්චියේ ගමන ආරම්භ විය යුතු ය.
- ගමන් කරන විට සියලු සිසුන් තම දකුණු අත වැළමිටෙන් නවා, උරහිසෙන් රවුමට කැරකිය යුතු ය.
- ඒ සමග කටින් කුජු කුජ් , කුජු කුජ් ලෙස දුම්රියේ හඬ නැංවිය යුතු ය. සියල්ලන් එක් ව හඬ නැගීම හා අත් කැරකීම කළ යුතු ය.
- එක් සිසුවෙකු අතරමග දී රතු සංඥාව දැක්විය යුතු ය.
- එවිට කෝච්චිය නතර විය යුතු ය.
- නැවත කහ සහ පසුව කොළ සංඥාව ලද විට ගමන ආරම්භ විය යුතු ය.

- ඊළඟ දුම්රිය ස්ථානය අසල දී එහි ස්ථානාධිපති දුම්රිය ගමන අතරතුර පණිවිඩ හුවමාරු සිදු කරන ස්ථානය රියැදුරු සිසුවාට ලබා දිය යුතු ය.
- ඉහත පරිදි අවස්ථා කිහිපයක දී රතු/ කහ/ කොළ සංඥා අනුව නැවතීම, ගමන් කිරීම සිදු කරන්න. මෙහි දී සෙමෙන් ,වේගයෙන් , මධ්‍යස්ථ ව ආදි ලෙස කරන්න.
- අවසානයේ දී අවශ්‍ය නම් දුම්රියෙන් බැස බසයට නැගීමට යන ආකාරය, කහ ඉරක් භාවිතයෙන් හා සංඥා භාවිතයෙන් සිදු කරන්න. (උදා: පාරේ වමින් ගමන/ කහ ඉර, කොළ පාට ඇති විට පාර මාරු වීම) සිසුන් කොටසක් වාහන ලෙස කටයුතු කරවන්න.
- වාහන ද සංඥා අනුගමනය කළ යුතු ය.
- ක්‍රියාකාරකම අවසානයේ දී පහත සඳහන් කරුණු සිසුන් සමග සාකච්ඡා කරන්න.
    - ➢ පාරේ ගමන් කරන විට අනුගමනය කළ යුතු විවිධ නීති රීති ඇති බව
    - ➢ ඒවා පදිකයන්ගේ ආරක්ෂාව සඳහා ඇති බව
    - ➢ ඒවා කඩ කරන විට දඬුවම් ලැබිය හැකි බව
    - ➢ බොහෝ අනතුරු පදිකයින් හා රියැදුරන් නීති කඩ කිරීම නිසා සිදුවන බව
    - ➢ අනතුරුවලින් වැළකීමට නීතිරීති අනුගමනය කළ යුතු බව
    - ➢ ඒ මගින් තමාගේ ආරක්ෂාව ඇතිවන බව
    - ➢ ක්‍රීයාකාරකම කිරීමේ දී සියලු දෙනා සාමූහික ව කටයුතු කළ බව
    - ➢ නීතිරීතිවලට අනුගත විය යුතු බව

### ❖ භූමිකා රංගන ඉදිරිපත් කරමු.

- තම ආසනය අහිමි වූ ගර්භනී කාන්තාවක් සිටගෙන සිටිනු දකින වැඩිහිටි දෙදෙනකු අතර කතාබහක්
- පාරුවක් පදින සීයා කෙනෙකු සමග එහි ගමන් කරන සිසුන් දෙදෙනකු අතර කතාබහක්
- ගුවනින් ගමනක් යාමට බලාපොරොත්තුවෙන් සිටින කෙනෙකු හා ගුවනින් ගමනක් ගිය ඔහුගේ යහළුවකු අතර සංවාදයක්